# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 06/2017**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017 පෙබරවාරි මස 20 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**සාමාන්‍ය උසස් කිරීම මඟින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය ( වෛද්‍ය /දන්ත වෛද්‍ය)-නොවන තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

1997.11.21 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 11 යටතේ සඳහන් කර ඇති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය ( සාමාන්‍ය උසස් කිරීම මඟින්) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය, 2012.10.09 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 996 හි සඳහන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ (වෛද්‍ය /දන්ත වෛද්‍ය-නොවන) තනතුර හා අදාළ විධිවිධාන සහ 2015.09.04 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 11/2015 කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කරවමි.

02. කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 11 යටතේ නියම කර ඇති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය ( වෛද්‍ය /දන්ත වෛද්‍ය)-නොවන තනතුරට උසස් කිරීම සඳහා වන සුදුසුකම් සංශෝධනය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2017.02.02 පැවැති සිය 958වන සභා වාරයේ දී තීරණය කරන ලදී.

03. **ඇමුණුම I** හි දක්වා ඇති සාමාන්‍ය උසස් කිරීම මඟින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය ( වෛද්‍ය /දන්ත වෛද්‍ය)-නොවන තනතුර සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය 2017.02.01 දින සිට ක්‍රියාත්මක වේ.

04. කරුණාකර ඒ අනුව කටයුතු කර මෙය සලකනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි අවධානයට යොමු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසී /එච්ආර්/ 2/3/106

ඊ/-

**11. තනතුර හා වැටුප් කේතය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, I ශ්‍රේණිය ( වෛද්‍ය /දන්ත වෛද්‍ය)-නොවන

U-AC 3 (1)

**බඳවා ගැනීමේ ක්‍රමය**

සාමාන්‍ය උසස් කිරීම මගින්

**සුදුසුකම්**

වැටුප් පරිමාණයේ උපරිම අගයේ වසරක් සම්පූර්ණ කර ලද හෝ එම ශ්‍රේණියේ වසර හයක (06) සේවය සම්පූර්ණ කරන ලද II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු උසස් කිරීම සඳහා සළකා බැලිය හැකිය.

හෝ

කථිකාචාර්ය (ආධුනික) ( වෛද්‍ය /දන්ත වෛද්‍ය)-නොවන තනතුර සඳහා පත් කරන ලද දින සිට වසර 11ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු උසස් කිරීම සඳහා සළකා බැලිය හැකිය.

**ක්‍රමවේදය**

අයදුම්කරු විසින් ඔහු /ඇය II ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු බවට පත් වූ දින සිට පහත දැක්වෙන ක්ෂේත්‍රයන්හි ඔහු /ඇය විසින් සිදු කරන ලද දායකත්වය විදහා දක්වන ස්වයං -ඇගයුමක් ඉදිරිපත් කළ යුතුය.

ඉගැන්වීම, පර්යේෂණ, දැනුම බෙදා දීම හා වෙනත් විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම්

සනාතන සභාව විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් ඉහත ස්වයං- ඇගයුම ඇගයීමට ලක් කර නිර්දේශයක් ඉදිරිපත් කරනු ඇත. මණ්ඩලය, ආදළ පීඨයේ පීඨාධිපති, සලකනු ලබන අධ්‍යයනාංශ ප්‍රධානී, සහ එක් අයෙකු අදාළ විෂය ක්ෂේත්‍රයේ දැනුමක් ඇති හෝ ආශ්‍රිත විෂය ක්ෂේත්‍රයක වන සහ අනෙකා වෙනත් පීඨයකින් වන සනාතන සභා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේය.

---